

# කවි අරණ

M.R.G. දුල්මිනී ශාක්‍යා මඩහපොල

# කවි අරණ

දුල්මිනී ශාක්‍යා මඩහපොල

වෙනත් කෘති-: මිතුරුකම දුරස්කල උගත්කම සහ තවත් කතා

වනයේ තනිවූ සිගිත්තිය

ISBN 978-624-208-117-5

2023.12.12

# පිදුම

මගේ ප්‍රාථමික අධ්‍යාපනය

සාර්ථකව නිම කිරීමට උර දුන් ,

ගලේවෙල ප්‍රාථමික විද්‍යාලයේ ,

ගුරු මඬුල්ලට ත් ,

මාගේ ජීවිතය ආලෝකමත් කිරීමට ,

උරදෙන මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ ,

ගුරු මඬුල්ලට ත් ,

ඉතා භක්භක්ත්‍යාදරයෙන්

මෙම පොත පිලිගන්වමි...

පෙරවදන

වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ මූලික ඉලක්කය වන්නේ දැනුමෙන් හා කුසලතාවලින් සන්නද්ධ ඵලදායී පුරවැසියෙකු සහ සැලකිලිමත් පවුලේ සාමාජිකයෙකු ගොඩගැසීමයි. පාසලේ ප්‍රධාන වගකීම වන්නේ දරුවන්ගේ දක්ෂතා හඳුනා ගැනීම සහ හඳුනා ගැනීම මෙන්ම ජාතියේ සහ ලෝකයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ කුසලතා මුවහත් කිරීමයි.

අපගේ අල්මා මේටර් නිරන්තරයෙන් නිර්මාණශීලී දරුවන්ට මඟ පෙන්වීම සහ සහාය ලබා දෙයි. මෙම ව්‍යාපෘතිය වසර ගණනාවක් තිස්සේ අපගේ පාසලේ අඛණ්ඩ ක්‍රියාවලියක් වී ඇත, විශේෂයෙන් පොත් ලිවීම සම්බන්ධයෙන්. බොහෝ දක්ෂ හා උද්යෝගිමත් තරුණ ලේඛකයින් වසර ගණනාවක් තිස්සේ මෙම අභ්‍යාසයට සහභාගී වූ අතර සාහිත්‍ය ක්ෂේත්‍රයට ආධුනික ලේඛකයින් බිහි කළහ. අපි මෙය සලකන්නේ මේ මොහොතේ විශාල ජයග් රහණයක් සහ ජාතික අවශ් යතාවයක් ලෙසයි.

මෙම ප්‍රයත්නය අඛණ්ඩව කරගෙන යාම සඳහා, අපි මෙම වසරේ ඩිජිටල් තාක්ෂණයන් සහ විද්‍යුත් පොත් ව්‍යාපෘතියක් අනුගමනය කළෙමු. මෙම සුවිශේෂී අවස්ථාව තරුණ තරුණියන්ට වටිනා අත්දැකීම් ලබා දුන් බව මම විශ්වාස කරමි.

අනාගතයේදී ඔවුන්ට ප් රයෝජනවත් වන අභියෝග. පාසල්වල තරුණ කතුවරුන් පෙළඹවීමේ වැදගත් පියවරක් ලෙස අධ් යාපන අමාත් යාංශය මෙම ව් යාපෘතිය අගය කර ඇත. මහාමායා බාලිකා විද් යාලයේ විදුහල්පතිනිය ලෙස මේ සඳහා දායක වූ රට පුරා සිටින සියලුම සිසු සිසුවියන්ට මම ස්තූතිවන්ත වෙනවා. මෙම දුෂ්කර කර්තව්‍යය සඳහා නොපසුබට උත්සාහය සහ භක්තිය සඳහා මෙම පොත්වල සියලුම තරුණ කතුවරුන් මම ප්‍රශංසා කර අගය කරමි.

මෙම වටිනා උත්සාහයට සහභාගී වීමට සිසුන් දිරිමත් කළ අපගේ පාසල් කළමනාකරණ කමිටුවට, සේවකයින්ට, දෙමව්පියන්ට, මා වෙනුවෙන් සිසුන්, පරිපාලකයින් සහ වෙනත් පාසල්වල ගුරුවරුන්ට මම ස්තූතිවන්ත වෙමි.

සෙනෙවිරත්න මහලේකම් මහතා මෙම ව් යාපෘතිය ආරම්භ කිරීම සඳහා ලබා දුන් විශාල සහයෝගය සහ සහාය ට මම ස්තූතිවන්ත වෙමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පති

මහාමායා බාලිකා විද් යාලය - මහනුවර

2023 10 20

# පටුන

(01) වැව් කුමරි........................................................................06

(02) නිදහස..............................................................................07

(03)රයේ අරුම.........................................................................08

(04)ටොමෝවේ මුල් ගුරුතුමනි...............................................................09

(05)සඳේ වත ගොත.......................................................................10

(06)අහිමි හිමිකම.........................................................................12

(07)කිරි අම්මා...........................................................................13

(08)සොඳුරු මොහොතක්....................................................................14

(09)කුරුල්ලෙක් කථා කරයි...............................................................15

(10)පාසල................................................................................16

# (1)වැව් කුමරි.....

ගොම්මන් අඳුරේ පියවර නගනා
කලුවර ගුරු පාරේ
කාල වලාකුළු තරු මිණි අමුණා
වැව් දිය ඉස්මත්තේ

තනිකම කකියන පාලු විමානෙක
තනි වූ කුමරියනී....
පෙරදා ලග උන් සියපත් හෙල්මැලි
හසරැල් නැතිව ද වැව් තීරේ...

රැහැයියනේ නුඹෙ නැලවිලි ගීයට
ඇදෙන පවන් වැල් රැලි මතිනේ...
කොහොමින් කොහොමට නුඹෙ නෙත් තෙමුණ ද
සමනල රැජිනියනී...

# (2)නිදහස...

සදැල්ලට සඳ නොවඩිනා දින
කාල අඹරේ සෝක සංකා
රැහැයි පැටවුනි නුඹට බාර ද
ගයන්නට ලොවට ම ඇසෙන්න ට

සඳලුතල මත පිපෙන කුසුමන්
දනිත් කෙලෙසක නිදහසක්
කැලෑ වන මල් දුටුවේ නැතිව ද
නිල් අහස් ගැබෙ විහගයින්

සී මැදුරුවෙන් එබෙන සඳම ද
පැල දොර ලග හිනැහුනේ
දෙරණ සිඟිනා උණු කඳුළුම ද
මුවග සිනහාවක් වුනේ

# (3)රැයේ අරුම...

රාත්‍රිය සොඳුරුයි ද මෙතරම්

දන්නෙ එය රැය පමණි මනරම්

තාරකාවෝ මවති මල්දම්

ගුවන් ගැබ පුරා සොඳුරු සිත්තම්

සඳේ සාවිගේ කඳුලැලී දෝ

තුෂර බිඳු වී මිහි සිඹින්නේ

සිඹින්නේ

තාරකාවක් අත වනා දෝ

නිශාචරයින් නෙත් අරින්නේ

සරා සඳක ට තනි සිතී දෝ

කුමුදු සමගින් දොඩන්නේ

මැදියමේ මේ අසිරියක් දෝ

පවන කවි කර ගයන්නේ

සා කුමාරි ගෙ සඳේ සිටිනා

දෙනෙත් තෙමුණා මැදියමේ

තරහ වී ඇගෙ වටේ සිටියේ

තාරකාවන් මහ රැයේ

ලෝ දනන් ඇත සිහින නින්දේ

චන්ද්‍රයා ගේ දිවි මගේ

මගේ දුක දැන් කාට කියම් ද

සිතුන දෝ සඳ කුමරියේ

# (4)ටොමෝවේ මුල් ගුරුතුමනි...

සෑම දිනක ම ප්‍රේම කර ලූ

ළපටි හසරැල් මන්දිරේ

කෙළි කවටකම් දඟකාරකම්

බොලඳ වදනින් නැහැවුනේ

එදා දූයිෂෙන් පියනැගූ ඒ

සුදු රෝස මල් මාවතේ

ලැබුන දෝ නුඹහටත් ඇරයුම්

ඇවිද යන්නට ඒ දිගේ

දිවිය කැප කර තැනූ විදුබිම

එක් ක්ෂණයකින් හැර ගියේ

දිනෙන් දිනය ට ඇදෙන රකුසා

ඇයි ද නුඹ නෙත් නුදුටුවේ

දුම්රියේ මැදිරියට

මැදිරියෙන් මැදිරියට

ගිනි දල්ල 'වින් හිනැහුනේ

නො ඇසුණා දෝ

ඔබට ඔබගේ

ටොමෝවෙහි ඉකිබිඳුම් සද්දේ

# (5)සඳේ වත ගොත...

එකමත් එක කාලෙක ලොව හිටියලු

සා කුමාරි නම් සොඳුරු ලඳක්

ඇගෙ ලස්සන බිඳ බිඳ අරගත්තලු

ඇගෙ වටෙ සිටි ඒ සතුරු කැලක්

රුව අඩු කරලා අගෙ තැන ගන්නට උපාය යෙදුවලු ඒ මිතුරන්

එසේ වුනත් අඩු වුනේම නැති ලූ

සා කුමරිගෙ වත ලස්සන නම්

කෝපෙන් පිපිරුනු ඒ සතුරන් කරාලු

කව්රුත් නොහිතු දෙයක්

සත් සමුදුරටත් වඩා ගැඹුරු ලූ

ඒ අපරාධයෙ තරම නම්

උහුලනු බැරි විට හඬගා හැඬුවලු

වර්ෂාවක් වී මුළු අහසක්

මුළු මහ දෙරණම තෙමී ගියා ලු

නිසල දේහයේ ඇගේ ලෙයින්

සුරංගනාවියො රැන් පිටින් බැස්සලු

පොළොවට වලාකුලෙන්

කුමරිගෙ නිසසල අත අල්ලාගෙන කිව්වලු

මන්තර මහා හඬින්

විදුලි කොට කොටා අහස කැඩුනලු

ලෝක විනාසය කියා නමින්

අලුත් ලොවක් තුල සැවොම මැවුනලු

පෙර කළ පිංවල බල මහිමෙන්

අලුතින් ඉපදුණු ලෝකෙට කිව්වලු

පෘථිවිය කියලා එක වචනෙන්

සා කුමරිගෙ සතුරන් ඉපදුණාලු

තරුවැල් සේ රෑ කලු අහසින්

තරුවැල් පිරිවර කරගෙන මැවුනලු

සා කුමරිය සඳ කුමරි නමින්

සඳ කුමරිගෙ මේ ජීවිත කථාව අහගෙන හිටියා ලු

සොඳුරු රැයක්

# (6)අහිමි හිමිකම...

හෙටින් අවසන් හුස්ම බිඳුවෙත්
ජාති ආගම් කුල සොයන්නට
කැප කරන විට පුරා දිවි මග
නොදැනුනේ කිම තනිකමක්

මේ බිමේ උරුමයට
අවි ගැටෙන කාලයක
ඇයි ද කිසිවෙකු නුදුටුවේ හිස
අසීමිත ඉඳුනිල් අඹර ගැබ

තල් ගසේ සිසිලසේ දැවටී
ගාලු වෙරලේ රැළි බලන්නට
උපන් හිමිකම අයිති නැතිව ද
මේ ලොවේ අසිරිය විඳින්නට

මහා රල චිත් කැටුව යනවිට
නොසැලකූ ජාතියක් කුලයක්
සොයන්නට වෙහෙසක් දැරුවේ කිම
සොබාදම් පාඩමට පිටුපා

# (7)කිරි අම්මා...

හිමිදිරියේ විකසිත කුසුමේ

පෙති එකිනෙක ගිලිහී ගියේ

සිහිනය අද්දර මතකය රඳවා

නුඹ කොතැනක අද සැඟව ගියේ

රහසේ දෙනෙතින් කඳුළු නොපැන්නට

නුඹේ නමින් වේ සෙනහේ හද යට

අනාගතය මග තොට පෙන්නන්න ද

සිහිනෙන් ඔබ මා රැගෙන ගියේ

සිහින මතක පිටු සිත අස්සේ

කුරුලු පැටව්විත් බත් පිඩු කවනවා

සුරංගනාවියෝ තෑගි බෙදනවා

ඉබි හාමිගෙනුත් පිහාටු ඉල්ලා

ඈතට පියඹන පුංචි සමනලී

මම ම යි ඔබගේ කථා මාළිගේ

ඔබෙ උණුසුම යට මියුරු හඬක් මැද

සොඳුරු ලොවක් වෙත මා කැඳවා

මගේම සිහිනෙට පියගැට තැන වූ

නුඹ මට මතකයි කිරි අම්මේ

# (8)සොඳුරු මොහොතක්...

ගුවන් ගැබේ තරු ඉහිරේ

ලොවම නිදන සුභ මොහොතේ

සිනාසෙසී සඳ එළියේ

කඩුපුල් මල් සුවඳ දැනේ

රැස් මාලා සුපුන් සඳේ

වළාකුලෙන් වැසී ගියේ

ගහ උඩ මුදුනෙම අත්තේ

කපුටු හාමි නිදි කිරුවේ

සමන් පිච්ච මල් පොකුරේ

වැව් ඉස්මත්තේ නැටුවේ

බැද්ද පුරා අඳුර නැතේ

කණාමැදිරි එළිය දිලේ

# (9)කුරුල්ලෙක් කථා කරයි...

වලාකුලෙන් බිමට වඩින
දිය බිඳුවක පාට අරන්
සිත්තම් කළ ආකාසේ
මං පියඹනවා
මං පියඹනවා

පාට පාට මල් පිපිච්ච
මල් පිරිලා සුවඳ ගලන
වනන්තරේ ගහක් මුදුනෙ
මං නිදියනවා
මං නිදියනවා

හඳේ හාවා බිමට පනින
සේපාලිකා දෙරණ සිඹින
පාන්දර ම හිරුත් එක්ක
මං හිනැහෙනවා
මං හිනැහෙනවා

# (10)පාසල...

විදුහල් බිමේ පියනගනා

දින ගානේ

මැවුණා ඔබගේ සෙනෙහස

හද යට මගේ

කඩා හැලෙන මල් වරුසා

වැසී මානේ

පවසමි නුඹගේ ගුණකඳ

මම මේ වේලේ

කඳුළු  නටන දෙනෙතින් මම

දෙපා තැබූ පළමු දිනේ

ඔබේ ගෝල ගුරු ඇදුරුන්

හිස අතගා සැනසූ දිනේ

අඳුරින් පිරි රැ දිවියට

ආලෝකය  පෙනුණ දිනේ

පහන් වැටක් වගෙයි ලොවට

පාසල් මැණිගේ සේවේ

..............නිමාව.................

පසුවදන

නවීන තාක්ෂණය සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයන් හි විහිදෙන විට, සිසුන් තාක්ෂණික මෙවලම් මත වැඩි වැඩියෙන් රඳා සිටිමින් නිර්මාණාත්මක ක්‍රියාවලියෙන් ඈත් වීමට නැඹුරු වේ. මෙම අවදානම අවම කිරීම සහ අපේක්ෂිත තරුණ ලේඛකයින්ට ඔවුන්ගේම පොත් නිෂ්පාදනය කිරීමට උපකාර කිරීම සඳහා, මම 2014 දී අධ්‍යාපන අමාත්‍යාංශයට පර්යේෂණ යෝජනාවක් ඉල්ලා ඉදිරිපත් කළෙමි. එය දරුවන්ට ඔවුන්ගේ උද්යෝගය සහ දැනුම ප්‍රදර්ශනය කිරීමට අපූරු අවස්ථාවක් විය. මහාමායා බාලිකා විද් යාලයේ සිසුවියන් වැඩිම පොත් ප් රමාණයක් ලියූ වාර්තාවක් පිහිටුවීමට සමත් වූයේ නව මට්ටමේ නව නිපැයුම් සඳහා මං පෙත් විවර කරමිනි.විද්යුත් පොත් ව් යාපෘතිය මගින් සිසුන්ට ජාත් යන්තර පාඨකයන් වෙත ළඟා වීමට හැකි වන අතර, අනාගතයට අධිෂ්ඨානශීලීව මුහුණ දීමට හැකි වන පරිදි නව අත්දැකීම් සහ අභියෝග ඔවුන් ලබා ගෙන ඇති බව මම විශ්වාස කරමි.

තරුණ ලේඛකයින් සියලු දෙනාටම ඔවුන්ගේ ඉදිරි කටයුතු සඳහා මම සුබ පැතුම් එක් කරමි

සෙනෙවිරත්න මහලේක්ම්

පාසල් ළමුන් අතර පොත් ප් රකාශන ව් යාපෘතියේ නිර්මාතෘ

2023 10 20